© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2010 මාර්තු විභාගය

විභාග දිනය : 2010 මාර්තු 14 | පිටු ගණන : 06
විභාග වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30 | ප්‍රශ්න ගණන : 09

<u>අයදුම්කරුවන්ට උපදෙස්:</u>

1. නියමිත කාලය පැය 3 කි.
2. I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II කොටසේ A කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද, B කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද උත්තර සපයන්න.
3. උත්තර එක් භාෂාවකින් (සිංහල) පමණක් ලියන්න.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර | (ECN / 505) |

---

## I කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රය

අංක 01 දරණ ප්‍රශ්නයේ සියලුම කොටස්වලට උත්තර සපයන්න. එක් එක් ප්‍රශ්නයට <u>වඩාත්ම නිවැරදි</u> උත්තරය තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය සමඟ පිළිතුරු පොතේ ලියන්න. උදා: **(1) (a), (2) (b)** වශයෙන්.

**<u>ප්‍රශ්න අංක 01</u>** *<u>(ලකුණු 20)</u>*

(1) විවේක කාලය සතුටින් ගතකරන තැනැත්තෙකුට දැන් රැකියාවක් ලැබී තිබේ. ඔහුගේ ආවස්ථික පිරිවැය කුමක් ද?
- (a) උපයන ආදායම
- (b) ලැබෙන පුහුණුව
- (c) සතුට ලැබීමට ඇති විවේක කාලය නැතිවීම
- (d) ප්‍රවාහන ගාස්තු

(2) ආරෝග්‍යශාලාවකට සියලුම රෝගීන්ට ප්‍රතිකාර දීමට අපහසු නම්, එයට උදාහරණයක් වනුයේ,
- (a) සීමිත අවශ්‍යතා
- (b) අධි සැපයුමක්
- (c) හිඟකම
- (d) අසීමිත සම්පත්

(3) සමාගමක් බහුජාතික යන නම ලබන්නේ,
- (a) එහි නිමැවුම් බොහොමයක් නිර්යාත කිරීම.
- (b) පරිමාණකූල පිරිමැසුම් ලබා තිබීම.
- (c) ව්‍යාපාර ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරීම.
- (d) එහි ශාඛා වෙනත් රටවල තිබීම

(4) කුඩා සිල්ලර වෙළෙන්දන්ට විශාල සමාගමක් සමඟ තරඟ කිරීමට උපකාර වන්නේ,
- (a) හොඳ පිහිටීම
- (b) අභ්‍යන්තර පරිමාණකූල පිරිමැසුම්
- (c) විවිධ වර්ගයේ භාණ්ඩ
- (d) ප්‍රචාරණය

(5) වාණිජ බැංකුවකට මහා බැංකු කාර්යයන් දී ඇත්නම්, එය කුමක් විය යුතු ද?
   (a) මූල්‍ය ප්‍රතිපත්ති පාලනය කිරීම.
   (b) විදේශ විනිමය පිළිබඳ කටයුතු කිරීම.
   (c) මුදල් ණයට දීම.
   (d) අධි ද්‍රවශීලතාවයන් තිබීම.

(6) පහත සඳහන් රූපසටහන් පෙන්වන්නේ භාණ්ඩයනට ඇති ඉල්ලුමයි. කුමන හේතුවක් නිසා එය X සිට Y දක්වා වෙනස් වේද?




   (a) රුචිය වෙනස්වීම.
   (b) චොක්ලට්වල මිල පහත වැටීම.
   (c) ආදායම වැඩිවීම.
   (d) ප්‍රචාරක ව්‍යාපාරය

(7) පහත සඳහන් රූපසටහන හාල්වලට ඇති වෙළඳපොළ දක්වයි.




   (a) A
   (b) B
   (c) C
   (d) D

(8) පොලී අනුපාතය වැඩි වූයේ නම්, ණය ගැනුම් හා ඉතිරිකිරීම්වලට කුමක් වේද?

| | ඉතිරිකිරීම් | ණය ගැනුම් |
|---|---|---|
| (a) | පහත වැටේ | පහත වැටේ |
| (b) | පහත වැටේ | ඉහළ යයි |
| (c) | ඉහළ යයි | පහත වැටේ |
| (d) | ඉහළ යයි | ඉහළ යයි |

(9) පහත සඳහන් රූපසටහන ව්‍යාපාරයක වියදම් පෙන්වයි.




ඒකක 100 ක නිමැවුමක් සඳහා ව්‍යාපාරයේ මුළු විචල්‍ය වියදම,

(a) රු. 100
(b) රු. 500
(c) රු. 10,000
(d) රු. 50,000

(10) ස්ථාවර වියදම් අධික වූ විට ව්‍යාපාරය එහි නිෂ්පාදනය කෙටිකාලීනව 50% කින් අඩු කරනු ලබනුයේ,
(a) සාමාන්‍ය වියදම් වැඩි වේ.
(b) ස්ථාවර වියදම් අඩු වේ.
(c) මුළු වියදම ස්ථාවරව පවතියි.
(d) විචලන වියදම වැඩි වේ.

(11) ඒකාධිකාර තත්ත්වයක් ඇති ව්‍යාපාරයක් මුහුණ දෙනු නොලැබේ.
(a) මහා පරිමාණ නිපැයුම්.
(b) රජයේ අවදානය ලබාගැනීම.
(c) ඉහළ මිලක් අයකිරීම.
(d) වෙළඳපොළේ තරඟයට මුහුණ දීම.

(12) ආර්ථික වර්ධනයට අහිතකර බලපෑමක් විය හැක.
(a) රජයේ බදු ආදායම පහත වැටීම.
(b) සම්පත් හීන වීම.
(c) සේවා වියුක්තිය වැඩි වීම.
(d) ජනයාගේ ජීවත තත්ත්වය පහළ බැසීම.

(13) පහත සඳහන් කියමන්වලින් චක්‍ර බද්ද විස්තර කරන්නේ,
(a) මග හැරීම පහසු වේ. ගෙවීම් විලම්භනය කෙරේ.
(b) ආදායම් මත පැවරීම නිසා උද්ධමනය ඇතිවීම.
(c) වියදම මත පැනවීම නිසා ප්‍රතික්‍රම බද්දක් වේ.
(d) අනුක්‍රමික බද්දක් බැවින් පරිභෝජනය දිරි නොගැන්වීම.

(14) දර්ශක අංකය සකස් කිරීමේ දී භාවිතා නොවන්නේ,
(a) පදනම් වර්ෂය
(b) භාණ්ඩ මල්ලක මිල
(c) පොලී අනුපාතය
(d) සෑම භාණ්ඩයකටම බර තැබීම.

(15) ජැමෙයිකා ඩොලරය, එක්සත් ජනපද ඩොලර් 4 සිට 5 දක්වා වෙනස් වුනි. ඒ ඇයි?
  (a) ඇමෙරිකා එක්සත් ජනපදයට ජැමෙයිකාවෙන් නිර්යාත ප්‍රමාණය අඩු වීම.
  (b) ඇමෙරිකා එක්සත් ජනපද ව්‍යාපාර ජැමෙයිකාහි ආයෝජනය අඩු වීම.
  (c) ඇමෙරිකා එක්සත් ජනපදයේ සිට ජැමෙයිකාවට ආයාත වැඩි වීම.
  (d) ඇමෙරිකා එක්සත් ජනපදයේ සිට සංචාරකයින් ජැමෙයිකාවට වැඩි වීම.

(16) ආර්ජන්ටිනාවේ අධි උද්ධමන ප්‍රතිශතය 1980 දශකවල 400% සිට 15% දක්වා 1990 දශකවල වැටුනි. ඒ මන්ද?
  (a) අධික මිල
  (b) නිර්යාත අඩු වීම
  (c) අවම වැටුප් ඉහල යාම
  (d) වෙළඳ හිඟය

(17) පහසු හා ඉක්මන් ක්‍රමයට රටවල් දෙකක් අතර ජීවන තත්ත්වය පැහැදිලි කිරීමට,
  (a) සතිපතා ලබන ආදායම
  (b) පාරිභෝජන වියදම
  (c) ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය
  (d) ජාතික ආදායම

(18) නගරයක පිටතින් නව මාර්ගයක් සෑදීමෙන් ඇතිවන බාහිර ප්‍රතිලාභයක් වනුයේ,
  (a) පරිසර දූෂණය වැඩිවීම
  (b) හදිසි තනතුරු අඩුවීම
  (c) දේපොළ වටිනාකම අඩුවීම
  (d) ඉදිකිරීම් සමාගමේ ලාභ වැඩිවීම

(19) චක්‍රීය සේවා වියුක්තියට හොඳ උදාහරණයක් ලෙස සැලකෙන්නේ,
  (a) අවපාතයකදී ගුවන් යානා සමාගමක් රැකියා අඩු කිරීම.
  (b) යන්ත්‍ර භාවිතය නිසා පවිත්‍රකරුවන්ගේ රැකියා නැති වීම.
  (c) වැඩිපුර මාළු ඇල්ලීම නිසා මාළු ඇල්ලන්නන්, මාළු ඇල්ලීම නැවැත්වීම.
  (d) සංචාරකයින් අඩු කාලසීමාවක දී හෝටල් ව්‍යාපාරිකයෝ සේවකයන් අඩු ප්‍රමාණයක් යෙදවීම.

(20) බාහිර ආර්ථික මිණුම් ඒකකයක් ලෙස සැලකෙන්නේ,
  (a) වෙනත් සමාගම්වලින් යන්ත්‍ර මිල දී ගැනීම.
  (b) වෙනත් සමාගම් සමඟ පර්යේෂණ ගෙන යාම.
  (c) වෙනත් සමාගම්වලට මුදල් ණයට දීම
  (d) වෙනත් සමාගම්වලට නිපැයුම් විකිණීම.

**(ලකුණු 01 x 20 = ලකුණු 20)**

**I කොටස අවසානයි**

## II කොටස

**A** අංශය

ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.

**<u>ප්‍රශ්න අංක 02</u>** *<u>(ලකුණු 20)</u>*

(a) රුසියාව හා චීනය නිදහස් වෙළඳ ආර්ථිකයක් කරා ගමන් කර තිබේ. කුමන ආර්ථික සාධක මීට හේතු වේද? *(ලකුණු 12)*

(b) සැලසුම් ආර්ථික ක්‍රමයක ලක්ෂණ විස්තර කරන්න. *(ලකුණු 08)*
*(මුළු ලකුණු 20)*

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 20)</u>*

(a) නිෂ්පාදන හැකියා මායිමක් ආශ්‍රයෙන් ආවස්ථික පිරිවැය නිර්වචනය කරන්න. *(ලකුණු 10)*

(b) හිඟකම හා තෝරාගැනීම යන වචනවලින් ඔබට හැඟෙවෙන්නේ කුමක් ද? *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 20)</u>*

(a) ඉල්ලුම් නීතිය පිළිගැනීමේ දී ස්ථාවරව පවතී යැයි උපකල්පනය කරනු ලබන අනෙකුත් සාධක පැහැදිලි කරන්න. *(ලකුණු 12)*

(b) ඉල්ලුම් ප්‍රසාරණය, සංකෝචනය හා ඉල්ලුම වැඩිවීම හා අඩුවීම අතර වෙනස පෙන්නුම් කරන්න.
*(ලකුණු 08)*
*(මුළු ලකුණු 20)*

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

(a) ආර්ථික විද්‍යාවේ කාර්යක්ෂමතාවය යනු කුමක් ද? විග්‍රහ කරන්න. *(ලකුණු 12)*

(b) පූර්ණ තරඟකාරී වෙළඳපොළක් හා සසඳන කළ ඒකාධිකාරී වෙළඳපොළක් හඳුනාගන්නේ කෙසේ ද? *(ලකුණු 08)*
*(මුළු ලකුණු 20)*

A අංශය අවසානයි

**B** අංශය

**ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 06** *(ලකුණු 20)*

(a) උද්ධමනය නිසා ආර්ථිකයට ඇතිවන ප්‍රධාන ප්‍රතිවිපාක විස්තර කරන්න. *(ලකුණු 12)*

(b) එවැනි අවස්ථාවන්හිදී මුදල්වල ප්‍රධාන කාර්යයන්ට කුමක් සිදුවේද? *(ලකුණු 08)*
*(මුළු ලකුණු 20)*

**ප්‍රශ්න අංක 07** *(ලකුණු 20)*

(a) ගෙවුම් ශේෂ ප්‍රකාශනයක වර්තන ගිණුම සකස් කරන්න. *(ලකුණු 10)*

(b) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ හිඟයක් ඇති වුවහොත් එය විසඳීමට ගත යුතු පියවර දක්වන්න. *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

**ප්‍රශ්න අංක 08** *(ලකුණු 20)*

(a) පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අයවැය වැදගත් වේ. ඒ කෙසේ ද? *(ලකුණු 10)*

(b) ආර්ථික වර්ධනය ඇති කිරීමට දිරිගැන්වීමක් ලෙස බදු භාවිතා කළ හැක්කේ කෙසේ ද? *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

**ප්‍රශ්න අංක 09** *(ලකුණු 20)*

(a) ආර්ථිකයට ජාතික ආදායම් සංඛ්‍යාලේඛන වැදගත් වන්නේ කෙසේ ද? *(ලකුණු 10)*

(b) ජාතික ආදායම් ගණනය කිරීමේ දී ඇතිවන ගැටලු මොනවා ද? *(ලකුණු 10)*
*(මුළු ලකුණු 20)*

B අංශය අවසානයි

II කොටස අවසානයි

ප්‍රශ්න පත්‍රය අවසානයි

---